මගේ අංක : ඩී5/සැරයන්/ජේ.උසස්වීම/2024
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2025.09.16

සියළුම බන්ධනාගාර අධිකාරින් සහ,
සහකාර බන්ධනාගාර අධිකාරින් වෙත

**බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිළධාරීන් ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත බන්ධනාගාර සැරයන් තනතුරට උසස් කිරීම - 2024(2025)**

මෙම දෙපාර්තමේන්තුවේ පවතින බන්ධනාගාර සැරයන් තනතුරේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා තනතුරේ ස්ථිර කර ඇති, 2024.12.31 දිනට නියාමක ශ්‍රේණියේ වසර 08ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්/නිලධාරිනියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**02.** ඒ අනුව ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත (ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්) සැරයන් (පිරිමි) තනතුරු 225ක් සහ සැරයන් (කාන්තා) තනතුරු 12ක් සම්පූර්ණ කිරීමට නියමිතය. (පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව 1:5 අනුපාතයට අනුව ජ්‍යෙෂ්ඨතා පිළිවෙලට නිලධාරීන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ)

**03.** වැටුප් බණ්ඩය හා පරිමාණය :-

I. වැටුප් බණ්ඩය - RS-2-2025 PS රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව
II. වැටුප් බණ්ඩය - 54,000 - 9 x 670 - 17 x 890 – 75,160

**04.** කාර්යක්ෂමතා කඩඉම් :-

සැරයන් තනතුරට පත්ව වසර තුනක් (3) ඇතුළත කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

**05.** සැරයන් තනතුරේ උසස් කිරීමේ ක්‍රමවේදය :-

**05.I ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය මත සැරයන් තනතුරට උසස් කිරීම.**

පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 66.67% ක් ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය මත හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සැරයන් තනතුරට උසස් කරනු ලැබේ. පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව 1:5 අනුපාතයට අනුව ජ්‍යෙෂ්ඨතා පිළිවෙලට නිලධාරීන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. උපරිම ලකුණු ලබා ගන්නා අනුපිළිවෙල අනුව පුරප්පාඩු ගණන සඳහා බඳවා ගනු ලැබේ. තවද සම්මුඛ පරීක්ෂණයට කැඳවීම පත්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේය.

**05.I.1. සපුරාලිය යුතු මූලික සුදුසුකම් :-**

I. පත්වීම ස්ථිර කර තිබීම.
II. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට (2024.12.31) නියාමක ශ්‍රේණියේ අවම වශයෙන් වසර අටක (08) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක අටක් (08) උපයාගෙන තිබීම.
III. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත්ව තිබීම.
IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා ඊට අනුශංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.
V. අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම.
VI. අනුමත කාර්ය සාධක ඇගයීමේ පටිපාටිය අනුව සුදුසුකම් ලබන දිනට (2024.12.31) පෙරාතුව වූ වසර අට (08) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

සටහන් :-

✓ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව , රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/03-05/04/2021 හා 2023.04.12 දිනැති ලිපිය අනුව සම්මුඛ පරීක්ෂණය පවත්වන දින වනවිටවත් සම්පූර්ණ කර තිබිය යුතුය.

✓ සක්‍රිය සේවා කාලය යනු :

නිලධාරියෙකු වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ.
(එසේම කාර්යපටිපාටික රීතිහි XXII වැනි පරිච්ඡේදයෙහි XXX අනුව )

✓ සතුටුදායක සේවා කාලයක් යනු :

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතින්හි XVII වැනි පරිච්ජේයේ 236(I) වගන්තිය අනුව නිලධාරියා වෙත ලබාදිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නීත්‍යානුකූල හේතූන් මත අත්හිටුවා හෝ අඩු කොට හෝ නතර කොට හෝ විලම්භනය කොට ඇති කාලපරිච්ඡේදයක් වේ නම් එයද, වැරදි පිළිබඳ පළමුවන උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදකට වරදකරු බවට නිගමනය කර ඇති විටක එම වරද සිදුකරනු ලැබූ දින සිට වසර තුනක කාලයක්ද, සහ වැරදි පිළිබඳ දෙවන උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදකට වරදකරු බවට නිගමනය කර ඇති විටෙක එම වරද සිදුකරනු ලැබූ දින සිට එක් වසරක කාලයක්ද සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කළ යුතු වන්නේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතින්හි XVII වැනි පරිච්ඡේදයේ 236(II) වගන්තිය අනුව ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ වැරදි පිළිබඳ පළමුවන උපලේඛනය යටතේ දක්වා ඇති වරදක් සම්බන්ධයෙන් දඬුවමක් ලබා ඇති නිලධාරියෙකු එම වරද සිදුකළ දිනයේ සිට වසර පහ(05)ක කාල සීමාවක්ද, ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ වැරදි පිළිබඳ දෙවන උපලේඛන යටතේ දක්වා ඇති වරදක් සම්බන්ධයෙන් දඬුවමක් ලබා ඇති නිලධාරියෙකු එම වරද සිදුකළ දිනයේ සිට වසර දෙකක(02)ක කාල සීමාවක්ද, ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 25.2 වන වගන්තිය යටතේ දක්වා ඇති ලඝු විනය ක්‍රියාපටිපාටිය යටතේ විනය දඬුවමක් ලබා ඇති නිලධාරියෙකු එම වරද සිදුකළ දිනයේ සිට එක් වසරක කාලසීමාවක්ද ගතවනතුරු බඳවාගැනීමේ පටිපාටි හා සේවා ව්‍යවස්ථාවන් අනුව සීමිත හා කුසලතා (සේවා පළපුරුද්ද) ධාරාවන් යටතේ බඳවා ගැනීමට හෝ පුරප්පාඩු සංඛ්‍යාව මත ලබාදෙනු ලබන ශ්‍රේණි උසස්වීමකට හෝ නුසුදුසු නිලධාරියෙකු ලෙස සැලකිය යුතු වන්නේය.

**05.I.2. අයදුම්පත් යොමු කළ යුතු ආකාරය :-**

✓. ඉහත දක්වා ඇති මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරින් සම්බන්ධව මෙම නිවේදනය අවසානයේ, ඇමුණුම් අංක 1 ලෙස අමුණා ඇති ආදර්ශ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර ඔබගේ නිර්දේශය සහිතව (නම සහිත නිල මුද්‍රාව තබා නිර්දේශ කළ යුතු වේ.) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2025.10.08 දිනට ප්‍රථම ලැබෙන සේ බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙත එවිය යුතුය.

✓ නියමිත ආදර්ශ ආකෘතියට අදාළ නොවන අයදුම්පත්, නිසි ලෙස සම්පූර්ණ නොකරන ලද අයදුම්පත්, නිවැරදි තොරතුරු ඇතුළත් නොකරන ලද අයදුම්පත් සහ නියමිත දිනයට පසුව එවනු ලබන අයදුම්පත් කිසිදු දැනුමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

✓ . නිලධාරීන්ගේ පුද්ගලික ලිපි ගොනු අංකය නිවැරදිව අයදුම්පත්‍රයේ සඳහන් කළ යුතුය.

**06.** නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරුවල නිවැරදිතාවය පිළිබඳ වගකීම ආයතනයේ අධිකාරී වශයෙන් ඔබ සතුවන බව මෙයින් දන්වන අතර, ඉහත කරුණු සම්බන්ධව නිලධාරීන් දැනුවත් කරන්න.

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (වැ.බ)



එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (වැ.බ.)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

## <u>සැරයන් තනතුර සඳහා ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත උසස්කිරීම අනුමත ලකුණු දීමේ පටිපාටිය</u>

| ලකුණු ලබා දෙන ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. ජ්‍යෙෂ්ඨත්වය (නියාමක තනතුරේ වසර 05ට පසු) | 60 | අදාළ නොවේ. |
| 2. ප්‍රශංසා | 05 | |
| 3. ක්‍රීඩා | 10 | |
| 4. සුභසාධක හා ආගමික කටයුතු | 05 | |
| 5.යහපත් සේවයට වාර්තා කිරීම (පසුගිය වසර 05 තුළ) | 05 | |
| 6.විෂය සමගාමී පාඨමාලා සහ වෙනත් උසස් අධ්‍යාපන සුදුසුකම් | 05 | |
| 7. සේවා කුසලතාවය | 05 | |
| 8. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |

**05.I.3.** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දීමේ ක්‍රමවේදය (ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත ) :-

I. ජ්‍යෙෂ්ඨතාවය සඳහා (ලකුණු 60)

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 හි සඳහන් විධිවිධාන පරිදි සම්මුඛ පරීක්ෂණයේදී ජ්‍යෙෂ්ඨතාවය සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.

II. කුසලතාවය සඳහා (උපරිම ලකුණු 40)

මෙහිදී ලබා දෙනුයේ වර්තමාන සේවා කාලයක් තුළදී කරන ලද කටයුතු වෙනුවෙන් පමණි.

**(අ). ප්‍රශංසා ( උපරිම ලකුණු 05)**

a) බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් දෙනු ලබන ප්‍රශංසාවකට (ලකුණු 02)
b) බන්ධනාගාර අධිකාරි ප්‍රශංසාවකට (ලකුණු 01)

**(ආ). ක්‍රීඩා (උපරිම ලකුණු 10)**

a) බන්ධනාගාර නියෝජනය කර ජය ගැනීම එක් ක්‍රීඩාවකට (ලකුණු 01)
b) දෙපාර්තමේන්තුව නියෝජනය කර ජය ගැනීම එක් ක්‍රීඩාවකට (ලකුණු 02)
c) රාජ්‍ය සේවා නියෝජනය කර ජය ගැනීම එක් ක්‍රීඩාවකට (ලකුණු 04)
d) මව්රට නියෝජනය එක් ක්‍රීඩාවකට (ලකුණු 05)

සටහන :-

එක් ක්‍රීඩාවකට ලකුණු ලබා දෙනුයේ ඉහළම නියෝජනයන් සඳහා පමණි. මෙ යටතේ ලැබු ජයග්‍රහණ සඳහා ලද ප්‍රශංසා වෙනුවෙන් ඉහත II - (අ) යටතේ නැවත ලකුණු දෙනු නොලැබේ.

(ඇ). සුභ සාධක හා ආගමික කටයුතු (උපරිම ලකුණු 05)

දෙපාර්තමේන්තුවේ හෝ බන්ධනාගාර ආයතන තුළ සුභ සාධක කටයුතු හා ආගමික කටයුතු හා සම්බන්ධ සමිතියක නිල තල දැරීම වෙනුවෙන් මේ යටතේ ලකුණු දෙනු ලැබේ.(වසරකටම)

a) දෙපාර්තමේන්තු මට්ටම සංගමයක සභාපති,ලේකම්,භාණ්ඩාගාරික තනතුරට (ලකුණු 02)
b) වෙනත් තනතුරකට (ලකුණු 01)
c) ආයතන මට්ටමේ සමිතියක සභාපති , ලේකම්, භාණ්ඩාගාරික තනතුරට (ලකුණු 01)
d) වෙනත් තනතුරකට (ලකුණු 01)

(ඈ). පසුගිය වසර 05 තුළ යහපත් සේවයට වාර්තා කිරීම ( 2024.12.31 දිනට පෙර) (උපරිම ලකුණු 05)

a) දින 1450 හෝ ඊට වැඩි (ලකුණු 05)
b) දින 1350 - 1449 අතර (ලකුණු 04)
c) දින 1300 - 1349 අතර (ලකුණු 03)
d) දින 1200 - 1299 අතර (ලකුණු 02)
e) දින 1150 - 1199 අතර (ලකුණු 01)

(ඉ). විෂය සමගාමී පාඨමාලා සහ වෙනත් උසස් අධ්‍යාපන සුදුසුකම් (ලකුණු 05)

a) උපාධිය (ලකුණු 05)
b) ඩිප්ලෝමා පාඨමාලා වසර 01 ට වැඩි (ලකුණු 03)
c) සහතික පත්‍ර පාඨමාලා මාස 06 ට වැඩි (ලකුණු 02)
d) සහතික පත්‍ර පාඨමාලා මාස 03 ට වැඩි (ලකුණු 01)
e) විෂය සමගාමී කෙටිකාලීන වැඩමුළු / වැඩ සටහන් (ලකුණු 1/2)

(ඊ). සේවා කුසලතාවය (ලකුණු 05)

a) ආරක්ෂක කාර්ය භාර නිලධාරී (ලකුණු 01)
b) ක්ෂේත්‍ර සේවා කාර්ය භාර නිලධාරී (ලකුණු 01)
c) දොරටු භාර නිලධාරී (ලකුණු 01)
d) මුළුතැන්ගෙයි භාර නිලධාරී (ලකුණු 01)
e) කාර්යාල කාර්ය භාර නිලධාරී (ලකුණු 01)

(උ). සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව (ලකුණු 05)

ඇමුණුම 01

<u>ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය මත සැරයන් තනතුරට උසස් කිරීමේ අයදුම්පත්‍රය - 2024(2025)</u>

පුද්ගලික ලිපිගොනු අංකය -

1. නිලධාරියාගේ / නිලධාරිනියගේ සම්පූර්ණ නම - ..................................................................................
..................................................................................................................................................
2. නිලධාරියාගේ / නිලධාරිනියගේ මුලකුරු සමඟ නම - ............................................................................
..................................................................................................................................................
3. සේවය කරනු ලබන ආයතනය - ..................................................................................................
4. උපන් දිනය- අවු:....................... මාස:....................... දින:...................
5. ස්ථිර නියාමක තනතුරට පත් වූ දිනය - .............../.........../............
6. 2024.12.31 දිනට සේවා කාලය - අවු:....................... මාස:....................... දින:..................
7. නියාමක තනතුර ස්ථිර කිරීම සම්බන්ධව (අදාල නොමැති වචන කපා හරින්න) - ඇත / නැත
8. ජ්‍යෙෂ්ඨත්වය පහත හෙළා ඇත්නම් ඒ පිළිබඳ විස්තර -...................................................................
..................................................................................................................................................
9. 2024.12.31 දිනට පූර්වාසන්න වසර 05 තුළ දොෂ දර්ශනයට ලක්ව තිබේද - ඔව් /නැත (ඔව් නම් විස්තර සඳහන්කරන්න )
..................................................................................................................................................
10. විසඳීමට විනය පරීක්ෂණ තිබේද -ඔව් /නැත (ඔව් නම් විස්තර සඳහන්කරන්න)...........................................
..................................................................................................................................................
11. 2024.12.31 දිනට පූර්වාසන්න වසර 08 තුළ වැටුප් වර්ධක උපයාගෙන තිබේද ? නැතිනම් ඉදිරියෙන් හේතු සඳහන් කරන්න.
    i. .........../....../...... දින වැටුප් වර්ධකය උපයාගෙන ඇත / නැත.................................................
    ii. .........../....../...... දින වැටුප් වර්ධකය උපයාගෙන ඇත / නැත.................................................
    iii. .........../....../...... දින වැටුප් වර්ධකය උපයාගෙන ඇත / නැත.................................................
    iv. .........../....../...... දින වැටුප් වර්ධකය උපයාගෙන ඇත / නැත.................................................
    v. .........../....../...... දින වැටුප් වර්ධකය උපයාගෙන ඇත / නැත.................................................
    vi. .........../....../...... දින වැටුප් වර්ධකය උපයාගෙන ඇත / නැත.................................................
    vii. .........../....../...... දින වැටුප් වර්ධකය උපයාගෙන ඇත / නැත.................................................
    viii. .........../....../...... දින වැටුප් වර්ධකය උපයාගෙන ඇත / නැත.................................................
12. ලබාගෙන ඇති අඩ වැටුප් හා වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර .....................................................
..................................................................................................................................................
13. වැටුප් රහිත විදේශ නිවාඩු ලබා ඇත්නම් ඒ පිළිබඳ විස්තර ..............................................................
..................................................................................................................................................
14. කාර්යක්ෂමතා කඩඉම් පිළිබඳ විස්තර (සමත් වූ දිනය ඉදිරියෙන් සඳහන් කරන්න)
    I. පළමු කඩඉම සමත්/ අසමත්/අදාල නොවේ...........................................
    II. දෙවන කඩඉම සමත්/අසමත්/අදාල නොවේ...........................................
15. රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය සම්බන්ධ විස්තර
    I. රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය ලබාගෙන ඇත / නැත /නිදහස් කර ඇත/ අදාල නොවේ

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

දිනය:.......................................                    අයදුම්කරුගේ අත්සන :..................................................

බන්ධනාගාර අධිකාරී විසින් සම්පූර්ණ කළ යුතුය

**1)** ඉහත 1 සිට 15 දක්වා නිලධාරියා / නිලධාරිනිය විසින් සඳහන් කර ඇති කරුණුවල නිවැරදිතාවය පහත පරිදි තහවුරු කරන්න. (නිවැරදි නොවන්නේනම් ඉදිරියෙන් නිවැරදි තොරතුරු ඇතුලත් කරන්න.)

- 1 කරුණ - නිවැරදියි / වැරදියි ..............................................................................................
- 2 කරුණ - නිවැරදියි / වැරදියි ..............................................................................................
- 3 කරුණ - නිවැරදියි / වැරදියි ..............................................................................................
- 4 කරුණ - නිවැරදියි / වැරදියි ..............................................................................................
- 5 කරුණ - නිවැරදියි / වැරදියි ..............................................................................................
- 6 කරුණ - නිවැරදියි / වැරදියි ..............................................................................................
- 7 කරුණ - නිවැරදියි / වැරදියි ..............................................................................................
- 8 කරුණ - නිවැරදියි / වැරදියි ..............................................................................................
- 9 කරුණ - නිවැරදියි / වැරදියි ..............................................................................................
- 10 කරුණ - නිවැරදියි / වැරදියි ............................................................................................
- 11 කරුණ - නිවැරදියි / වැරදියි ............................................................................................
- 12 කරුණ - නිවැරදියි / වැරදියි ............................................................................................
- 13 කරුණ - නිවැරදියි / වැරදියි ............................................................................................
- 14 කරුණ - නිවැරදියි / වැරදියි ............................................................................................
- 15 කරුණ - නිවැරදියි / වැරදියි ............................................................................................

**2)** නියාමක තනතුරට අදාල සේවා කාලය තුළ ලබා ඇති ප්‍රශංසා ගණන

- බන්ධනාගාර කොමසාරිස් ජනරාල් - .............................
- බන්ධනාගාර අධිකාරී - ....................................

**3)** පැමිණීමේ දින ගණන

- 2020.01.01 දින සිට 2020.12.31 දක්වා දින ගණන - ...............................................
- 2021.01.01 දින සිට 2021.12.31 දක්වා දින ගණන - ...............................................
- 2022.01.01 දින සිට 2022.12.31 දක්වා දින ගණන - ...............................................
- 2023.01.01 දින සිට 2023.12.31 දක්වා දින ගණන - ...............................................
- 2024.01.01 දින සිට 2024.12.31 දක්වා දින ගණන - ...............................................

දින ගණනෙහි එකතුව - ...............................................

ඉහත නම සඳහන් නිලධාරියා /නිලධාරිනිය මෙම ආයතනයේ සේවය කරන බවත්, නිලධාරියාගේ පුද්ගලික ලිපි ගොනු අංකය .................................. බවත්, නිලධාරියාගේ / නිලධාරිනියගේ වැඩ, පැමිණීම සතුටුදායක / අසතුටුදායක බැවින් සැරයන් තනතුරට උසස් කිරීම නිර්දේශ කරමි / නොකරමි.

දිනය - ......................................

බන්ධනාගාර අධිකාරීගේ අත්සන - ..........................................

(නිල මුද්‍රාව තබන්න)